ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2020 ජනවාරි 16 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2019 දෙසැම්බර්

2019 දෙසැම්බර් මාසයේ දී නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය අඩු වේගයකින් වර්ධනයක් පෙන්නුම් කරමින්, දර්ශක අගය 54.3 ක් ලෙස වාර්තා වූ අතර, නව ඇණවුම්, නිෂ්පාදන සහ සේවා නියුක්තියෙහි සිදුවූ මන්දගාමී වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**54.3**

**2019 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.7 ක පහළ යාමකි.**

නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක 2019 නොවැම්බර් මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වුවද වර්ධනයක් පෙන්නුම් කරන ලදී. නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශක අඩු වේගයකින් ඉහළ යාම කෙරෙහි රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයන්හි දක්නට ලැබුණු මන්දගාමී වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය. උත්සව සමයේ වඩා හොඳ වැටුප් සහිත තාවකාලික රැකියා සඳහා සමහර සේවකයින් යොමු වීම, විශේෂයෙන්ම රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයන්හි රැකියා නියුක්තියෙහි සැළකිය යුතු අඩු වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. නිෂ්පාදනයෙහි අඩු වර්ධනය කෙරෙහිද මෙම සේවා නියුක්තියෙහි දක්නට ලැබුණු මන්දගාමීත්වය යම් දුරකට බලපා ඇත.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

තවද, නව ඇණවුම් සහ නිෂ්පාදන අඩු වේගයකින් වර්ධනය වුව ද, එළඹෙන චීන නව අවුරුදු නිවාඩුව සමග ඇතිවිය හැකි සැපයුම් බාධා සැලකිල්ලට ගනිමින් ඉදිරි නිෂ්පාදන අවශ්‍යතා සඳහා අවශ්‍ය තොග කල්තියා ඇණවුම් කිරීම හේතුවෙන් ගැනුම් තොග ඉහළ වේගයකින් වර්ධනය විය. තවද, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතුණි.

| විචලයය | නොවැ. | දෙසැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **56.0** | **54.3** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 57.1 | 56.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 57.1 | 56.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 57.7 | 51.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ගැනුම් තොගය | 55.6 | 56.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 50.0 | 50.0 | = | නොවෙනස් මට්ටමේම පැවැතීම |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2019 දෙසැම්බර් මාසයේ දී නොවෙනස් මට්ටමේ පැවති, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකය හැර ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි අනෙකුත් සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරමින්, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ත වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.2 කින් පහළ යමින් 2019 දෙසැම්බර් මාසයේදී 50.1 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2019 දෙසැම්බර් මාසයේදී, එක්සත් රාජධානිය, යුරෝපා කලාපය, චීනය සහ එක්සත් ජනපදය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කරන ලද අතර ඉන්දියාව, සිංගප්පූරුව සහ රුසියාව නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2020 ජනවාරි 16 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

2019 දෙසැම්බර් මාසයේ දී සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, මාස 24 කින් වාර්තා වූ ඉහළම අගය වන දර්ශකාංක 60.2 දක්වා ඉහළ ගිය අතර, සෘතුමය විචලන, දේශපාලන ස්ථාවරත්වය සහ රජය විසින් ආර්ථික කටයුතු වර්ධනය කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග හේතුවෙන්, 2019 දෙසැම්බර් මාසයේ දී නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ ඉහළ වර්ධනය මේ සඳහා හේතු විය.

උත්සව සමය මෙන්ම සංචාරකයන් වැඩි වශයෙන් මෙරටට පැමිණෙන සමය වීම හේතුවෙන් තොග සහ සිල්ලර වෙළඳාම සහ නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා යන උප අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්හි ඉහළ වර්ධනයක් වාර්තා විය. ප්‍රතිනැව්ගත කිරීම් ප්‍රමාණයේ වර්ධනයත් සමඟ භාණ්ඩ ප්‍රවාහනයෙහි වර්ධනයක් වාර්තා වූ අතර, නිවාඩු සමය සමඟ විවේක ක්‍රියාකාරකම් වැනි වෙනත් පෞද්ගලික සේවාවන් ද වර්ධනය විය.

අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය වූ අතර, ප්‍රතිචාර දක්වන්නන් විසින් නව බදු සංශෝධන හේතුවෙන් ඔවුන්ගේ ව්‍යාපාරවල ඉහළ වර්ධනයක් අපේක්ෂා කරන බව සඳහන් කරන ලදී.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**60.2**

**2019 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.8 ක ඉහළ යාමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචලයය | නොවැ. | දෙසැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.4** | **60.2** | **+** | **වැඩි වේගයකින් ඉහළ යැමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 52.2 | 63.0 | + | වැඩි වේගයකින් ඉහළ යැමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 59.0 | 67.8 | + | වැඩි වේගයකින් ඉහළ යැමක් |
| සේවා නියුක්තිය | 49.4 | 47.0 | - | වැඩි වේගයකින් පහළ යැමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 48.1 | 50.0 | + | පහළ යැමක සිට නොවෙනස්ව පැවතීමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 78.1 | 73.3 | - | අඩු වේගයකින් ඉහළ යැමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ව්‍යාපාර ක්‍රියාකාරකම්වල ඉහළ වර්ධනයක් වාර්තා වුවද, පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් ප්‍රමාද වීම හේතුවෙන් 2019 දෙසැම්බර් මාසයේ දී බොහෝ අංශවල සේවා නියුක්තිය පහළ ගියේය. ඒ අනුව, සේවා අංශයේ සේවා නියුක්ති දර්ශකය දර්ශකාංක 50.0 (කඩඉම් මට්ටම) ට වඩා අඩු අගයක අඛණ්ඩව නවවන මාසයටත් පැවතුණි. 2019 නොවැම්බර් මාසයට සාපේක්ෂව නිම කිරීමට ඇති කාර්යයන් නොවෙනස්ව පැවති බව පෙන්නුම් කරමින්, නිම කිරීමට ඇති කාර්යයන් උප දර්ශකය කඩඉම් මට්ටම දක්වා ඉහළ යන ලදී.

### ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 නොවැම්බර් මාසයේ දී වාර්තා වූ 51.6 හි සිට 2019 දෙසැම්බර් මාසයේ දී 52.1 ක් දක්වා ඉහළ යන ලදී.

ඉන්දියාව, චීනය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ 2019 නොවැම්බර් මාසයට සාපේක්ෂව දෙසැම්බර් මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කළ අතර, ජපානයෙහි සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය මගින් සේවා අංශයෙහි පහළ යැමක් පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2020 ජනවාරි 16 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචලයයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචලයයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.